# බටහිරයන්ගේ ථෙරවාද බෞද්ධ විරෝධතාව

මේ වන විට බ්‍රිතාන්‍ය තම වෙස් මුහුණ ගලවා දමා ඇත. හැංගි හැංගි වෙස් බැන්ද ද නටන්නට සිදුවන්නේ එළියේ ය. බ්‍රිතාන්‍ය විදේශ ඇමති මිලිබෑන්ඩ් ක්‍රියාකරන්නේ ලංකාවට එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට යම් ඉඩක් සපයා ගැනීමට ය. ඔහු එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි ආරක්ෂක මණ්ඩලයෙහි දී වෙනත් කරුණු යටතේ ලංකාව ගැන කතාකිරීමට අවසර පැතී ය. එහෙත් රුසියාව, චීනය හා වෙනත් රටවල් ඔහුගේ අවශ්‍යතාව පරාජය කෙළේ ය. රුසියාව, චීනය වැනි රටවලට අපේ සම්පූර්ණ ගෞරවය හිමිවිය යුතු ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව සටනට අද ඒ නූතනත්වය බලහත්කාරයෙන් පටවන ලද රටවල් බොහෝමයක් එකට එකතු වෙමින් පවතී. එහි දී ලංකාවේ ක්‍රියාකාරීත්වය මැනවින් කැපී පෙනෙයි. පනස් ගණන්වල යුරෝපීය නොවන රටවල ඇති වූ ජාතිකත්ව ව්‍යාපාර නැවත වරක් වෙනත් මුහුණුවරකින් පැන නැගෙමින් ඇත. ඒ ව්‍යාපාරයට නායකත්වය දීමේ හැකියාව ලංකාවට වෙයි.

මිලිබෑන්ඩ් නිව්යෝක් නුවර දී ලංකාවට එරෙහිව පුවත්පත් සාකච්ඡාවක් ද පැවැත්වී ය. ඔහුට තවත් කිරීමට ඉතිරි වී ඇත්තේ ලන්ඩනයේ වික්ටෝරියා දුම්රියපොළ ඉදිරිපිට පිකට්ටුවක් පැවැත්වීම ය. ඒ සඳහා අවශ්‍ය නම් මෙරට ජඩමාධ්‍ය ව්‍යාපාරයේ කුප්‍රකට පිකට්ටුවන් කිහිප දෙනකු ඔහුගේ සහායට ගෙන්වාගත හැකි ය. මොවුන්ගෙන් ඇතැමකු ලංකාවෙන් පිටවී සිටීම නිසා මේ දිනවල කොටුව දුම්රියපොළ ඉදිරිපිට රඟපෑමක් දැකගැනීමට ද නොහැකි ය. මිලිබෑන්ඩ් කීයක් වියදම්කර වුවත් ඔවුන් ලංඩනයට ගෙන්වා ගතහොත් බීබීසිය, සී එන් එන් වැනි ආයතන ඔවුන්ගේ පිකට්ටු රූප ලෝ පුරා ප්‍රචාරය කර හරින බැවින් අපට ද කලකට පසුව ඔවුන්ගේ රූප දැකගැනීමට හැකිවනු ඇත. පසුගිය කාලයේ සොල්හයිම් හා නෝර්වේ ලවා තම කාර්ය ඉටුකරගත් බ්‍රිතාන්‍ය අද එළිපිට ම සිංහල විරෝධී ව්‍යාපාරයට මැදිහත්වීමට පටන්ගෙන ඇත. එමගින් මිලිබෑන්ඩ් මිලිලීටර ප්‍රමාණයට කුඩා වී දියාරු වී ඇති බව සිංහල විරෝධීන්ට නොතේරෙනවා ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සශ්‍රීක අවධියෙහි ලෝක බලවතා බවට පත්වී සිටි බ්‍රිතාන්‍යයේ විදේශ ඇමතිවරයා ලංකාවට විරුද්ධව පුවත්පත් සාකච්ඡා පවත්වන තත්වයකට පල්ලම් බැස ඇත්තේ ඇයි? බ්‍රිතාන්‍ය සිංහල විරෝධීන් පැහැදිලිව ම බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ වක්‍ර අනුදැනුම යටතේ ලංඩනයේ කිංග්ස්බරි පන්සලට ද පහර දී ඇති බව වාර්තා වෙයි. ඊනියා ආගමික නිදහස,ආගමක් ඇදහීමට ඇති නිදහස,අදහස් ප්‍රකාශ කිරීමට ඇති නිදහස, කෙටියෙන් කියන්නේ නම් රනිල් වික්‍රමසිංහ මහතා නිතර කතාකරන මානව හිමිකම් අයිතිය බ්‍රිතාන්‍යයේ වෙසෙන අතළොස්සක් පමණ වූ සිංහල බෞද්ධයනට නැති බව පැහැදිලි ය. බීබීසී ජඩමාධ්‍යය පන්සලට පහරදීම පිළිබඳ ඊනියා ප්‍රබුද්ධයන්ගේ විරෝධතාව ගැන වාර්තාකිරීමට උත්සාහ නොගන්නේ එවැනි විරෝධතා නොමැති බැවින් ද?

අද මෙරට ඇතැම් උගත්තු ද බ්‍රිතාන්‍යයේ දෙබිඩි පිළිවෙතක් ගැන කතාකරති. බ්‍රිතාන්‍ය ඇෆ්ගනිස්තානයේ දී එක් ආකාරයකිනුත් ලංකාවේ දී වෙනත් ආකාරයකිනුත් ක්‍රියාත්මක වන්නේ ඇයිදැයි ඔවුහු අසති. මෙතෙක් කල් බ්‍රිතාන්‍යයන්ගේ කිසිම නරකක් නොදුටු මේ උගතුන්ට ඒ අයුරින් වුව ද බ්‍රිතාන්‍ය ප්‍රශ්නකිරීමට සිදුවීම දෛවයේ සරදමක් විය හැකි ය. එහෙත් මෙරට බොහෝ දෙනා තමන් ලබාගත් අත්දැකීම් මත පදනම් ව නිසි නිගමනවලට බැසීමට නොහැකිවීමේ කරුමයට උරගසා සිටිති. ඒ එක් අතකින් ඔවුන් ලබාගත් අධ්‍යාපනයෙහි, එනම් බ්‍රිතාන්‍යයන් අපට ලබාදුන් අධ්‍යාපනයෙහි වරද ය. බ්‍රිතාන්‍යයේ දෙබිඩි පිළිවෙතක් නැත. ඔවුහු තම සංස්කෘතිය රැකගැනීමට කටයුතු කරති. තමන්ට විරුද්ධ ව්‍යාපාර වැනසීමටත් තම සංස්කෘතියට අභියෝගයක් වූ සංස්කෘතිවලට විරුද්ධ ත්‍රස්තවාදවලට සහාය දීමත් ඔවුන්ගේ ප්‍රතිපත්තිය වෙයි.

අතනින් මෙතනින් මෙරට දෙමළ ජාතිවාදයට, බෙදුම්වාදයට හා ත්‍රස්තවාදයට අතනොහසා ප්‍රශ්නය සමස්තයක් ලෙස නොදැකීමේ වරදට අද අපි වන්දි ගෙවමු. එහෙත් අප තවමත් පමා වී නැත. අපට නිවැරදිකරගැනීමට ඇත්තේ කරුණු කිහිපයක් පමණ ය. අපට ඒ ටික කළහැකි නම් දෙමළ ප්‍රශ්නය අපට මුලිනුපුටා දැකිය හැකිවනු ඇත. සමස්ත දෙමළ ප්‍රශ්නයේ ම මුළ ඇත්තේ බ්‍රිතාන්‍ය හා ඕලන්දය හෙවත් නෙදර්ලන්තය බව අප කියා ඇත්තේ එක් වරක් පමණක් නො වේ. ලන්දේසිහු තම දුම්කොළ වගාව සඳහා කෝරමණ්ඩල වෙරළින් දෙමළ කුලීකරුවන් හෙවත් වෙල්ලාලයන් හෙවත් කෘෂිකාර්මික කුලීකරුවන් මෙරටට ගෙන එමෙන් හා බොරු ඉතිහාසයක් ලිවීමට යාල්පානම් වෛපව මාලෙයි කතුවරයාට අනුබල දීමෙන් ප්‍රශ්නය ආරම්භ කළහ. බ්‍රිතාන්‍යහු එක් වෙල්ලාල

© Prof. Nalin De Silva

පවුලක් ලංකාවේ නායකත්වයට පත්කිරීමටත් පොදුවේ ඉංගිරිසි උගත් දෙමළ ජනයා මෙරට නායකයන් බවට පත්කිරීමටත් කටයුතු කලහ. එසේ ආරම්භ වූ ව්‍යාපාරය ත්‍රස්තවාදයක් බවට පත්වීමේදීත් ඒ ත්‍රස්තවාදය නඩත්තුකිරීමේදීත් බ්‍රිතානිය ක්‍රියාකර ඇති බව මේ වන විට පැහැදිලි විය යුතු ය. නොර්වේ යනු බ්‍රිතානියේ නියෝජිතයා පමණක් විය. නෝර්වේ මෙහි පැමිණියේ මන්නාරම අසළ මුහුදේ තෙල් ටික හා නැගෙනහිර වෙරළේ ඛනිජ වැලි දෙස පමණක් ඇස ගසා ගෙන යැයි තවමත් සිතන්නේ නම් විසි එක්වැනි සියවස අවසන් වීමෙන් පසුව ද අපට විමුක්තියක් හෝ නිදහසක් හෝ නොලැබෙනු ඇත. එහෙත් අප ප්‍රශ්නය තේරුම් ගන්නේ නම් අපට අවුරුදු කිහිපයක් ඇතුළත පූර්ණ ජයග්‍රහණයක් ලබාගැනීමට හැකිවනු ඇත.

බ්‍රිතානීහු මුල සිට ම සිංහල බෞද්ධයනට එරෙහිව දෙමළ ජනයා මෙහෙයවූහ. ලංකාවේ  දෙමළ ජාතිකවාදය බ්‍රිතානීන්ගේ ව්‍යාපාරයක් විය. ඒ ව්‍යාපාරය එදා මෙන් ම අද ද හින්දු චින්තනයක් මත පදනම් නො වී ය. දෙමළ ජාතිකවාදය එදත් අදත් දෙමළ ජාතිවාදයක් විය. මෙරට දෙමළ ජාතිවාදයේ අරමුණ වූයේ සිංහලත්වයට හිමි තැන අහිමි කිරීම ය. දහනවවැනි සියවසේ හතරවැනි දශකය වන විට ද බ්‍රිතානීන්ගේ දෙමළ ජාතිවාදය මෙරට මුල්බැස ගෙන තිබුණි. එදා බ්‍රිතානීන් අද ප්‍රමාණයට දැනුවත්ව සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහිව දෙමළ ජාතිවාදය යෙදවී යැයි මෙයින් අදහස් නො කෙරෙයි. බ්‍රිතානීන් අත්පත් කරගත් බොහෝ රටවල ප්‍රධාන සංස්කෘතික ධාරාවන්ට එරෙහිව වෙනත් සංස්කෘතික ධාරා යොදාගැනීම බ්‍රිතානීන්ගේ උපාය විය.

එහෙත් කල්යෑමේ දී බ්‍රිතානීන්ට සිංහල බෞද්ධ සංස්කෘතිය තම ප්‍රධාන සතුරා බව වැටහෙන්නට වී ඇති බව පැහැදිලි ය. පොදුවේ ගත්කල බටහිරයෝ ථෙරවාද බෞද්ධ සංස්කෘති විනාශකිරීම සඳහා කටයුතු කරති. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අද සටන් වදින්නේ එයට විරුද්ධව ආයුධ ගත් මුස්ලිම් සංස්කෘතිය සමග ය. ඇතැම් මුස්ලිම් නායකයන් බටහිරයන්ගේ නූතනත්වය පිළිගෙන ඇති නමුත් මුස්ලිම් සංස්කෘතිය ආයුධ ගෙන ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව සටන් වදියි. එහෙත් කිසිම ථෙරවාදි බෞද්ධ රටක් ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව සටන් වැද නොමැත. එසේ වුව ද බටහිරයෝ ථෙරවාද බෞද්ධ සංස්කෘතියට එරෙහිව විවිධ අයුරින් කටයුතු කරති. ඔවුහු ලංකාවේ ථෙරවාද බෞද්ධ සංස්කෘතියට එරෙහිව දෙමළ ජාතිවාදය, බෙදුම්වාදය හා ත්‍රස්තවාදය යොදාගනිති. ඔවුන් කොටින්ට සපයා ඇති ආයුධ ප්‍රමාණය හුදෙක් ඊළමක් පිහිටුවීමට ලබාදුන් දෑ නොවන බව මේ වන විට පැහැදිලි ය. ඒ අවිවලින් මුළු ලංකාව ම නැවතත් බ්‍රිතානීන්ගේ (බටහිරයන්ගේ) සෘජු යටත්විජිතයක් බවටත් ප්‍රභාකරන් එහි ආණ්ඩුකාරයා බවටත් පත්කිරීමේ හැකියාවක් විය. මියන්මාරයේ, තායිලන්තයේ ලාඕසයේ කාම්බෝජයේ ථෙරවාද සංස්කෘතිය දුර්වල කිරීමට, හැකිනම් නැතිකිරීමට, බටහිරයන් ක්‍රියාකරන බව පැහැදිලි ය.

බටහිරයෝ මහායානයට ඒ අයුරින් නො සලකති. දලයි ලාමා අද බටහිරයන්ගේ ගෞරවයට පාත්‍ර වෙයි. මහායාන බුද්ධාගම බටහිර රටවල වේගයෙන් නොවුවත් පැතිරී යයි. බටහිර රටවල ඇතැයි කියන ඊනියා බෞද්ධ ප්‍රබෝධය මහායානය මුල්කරගත් එකක් විනා ථෙරවාදී ප්‍රබෝධයක් නො වේ. අද මහායානය ආත්මවාදී පෞද්ගලිකත්වය අගයන ඉන්ද්‍රිය පිනවීම බැහැර නොකරන සංස්කෘතියක් බවට පත් වී අවසාන ය. ජපානය, කොරියාව ආදී මහායාන රටවල් දියුණුවීමටත් ථෙරවාද බෞද්ධ රටවල් දියුණු නොවීමටත් ඇති හේතුව කුමක් ද? මෙහි දියුණුව යන්න නිරපේක්ෂ වාස්තවික අර්ථයක් ගෙන දෙන්නක් නො වේ. අද ලෝකයේ දියුණුව යන්නෙන් අදහස් කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මත පදනම් වූ දියුණුවක් බව රහසක් නො වේ. මහායාන රටවල් දියුණුවන්නේ ඒ රටවල සංස්කෘතියට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වැළඳ ගැනීමට හැකි වූ බැවිනි. ථෙරවාද රටවලට එසේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තම සංස්කෘතියට අවශෝෂණය කරගැනීමට නොහැකි වී ඇත. අද ඇතැමුන් මහායානය හා ථෙරවාදය අතර වෙනසක් නැතැයි යන ගජබින්නය ප්‍රචාරය කරන්නේ බටහිර උගතුන්ගේ අනුදැනුම හා අනුග්‍රහය යටතේ ය. මහායානය හා ථෙරවාදය අතර වෙනසක් නැති බවට ව්‍යාජ මතවාද සකස්කර ථෙරවාදයට ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය රිංගවීම මේ ව්‍යාපෘතියෙහි අරමුණ වෙයි. දැන් ප්‍රශ්නය වනුයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ථෙරවාදී සංස්කෘතිවලට මෙතරම් විරුද්ධවන්නේ ඇයි ද යන්න ය. ඒ තේරුම් ගැනීමට අප අවුරුදු පන්සීයයකට ඉහත දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇරඹීම හැදෑරිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva